# පුරප්පාඩු

**සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.**

## තනතුර : කළමනාකරණ සහකාර III තනතුර - පුරප්පාඩු සංඛ්‍යාව 02 කි

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**

- ➢ අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04 කට සම්මාන තිබීම.

**හෝ**

- ➢ ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සහිතව අ.පො.ස. සා/පෙළ සමත්වීම සහ ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසරකට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

- ➢ කාර්යාල කළමනාකරණ විෂයයට සම්මාන සහිතව ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

**හෝ**

- ➢ කාර්යාල කාර්ය සහායක තනතුරේ I පන්තියේ වසර 05 ක පළපුරුද්ද.

**පොදු කොන්දේසි**

01. බැංකු හා ගිණුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද, පරිගණක හැකියාව මෙන්ම ස්වර්ණාභරණ උගසට ගැනීම පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වනු ඇත.
02. වයස් සීමාව අවු. 18 ත් අවු. 45 ත් අතර විය යුතුය. දැනට සමුපකාර ක්ෂේත්‍රයේ යෙදී සිටින අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු ඇත.
03. වැටුප රු. 21,700 - 250X10 - 275X10 - රු. 26,950.00 (මීට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභා අනුමත දීමනා හිමිවේ. ආරම්භක සාමාන්‍ය දළ වැටුප රු.55,000/- ක් පමණ වේ)
04. ආහාර හා නිල ඇඳුම් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත වෙනත් දීමනාද හිමි වේ.
05. සියළුම ඉල්ලුම්පත්‍ර අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳව සහතිකවල සහ පදිංචිය සනාථ කිරීම පිළිබඳව සහතිකයේ ඡායා පිටපත් සමග 2024.12.11 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
06. ලියාපදිංචි සමුපකාර සමිති/සංගම්හි සේවයේ නියුක්ත වූවත් තමන් සේවය කරන සමුපකාර සමිතියේ, සංගමයේ ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය,**
**අංක. 724/1/1, බියගම පාර,**
**පිලපිටිය, කැළණිය.**

**දු. අංක 0112918657**